**මරිය හමුදා යාච්ඤා - ( තෙස්සෙරාව ) -**

පිතාගෙත් පුත්‍රයාගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයෙන් ආමෙන්..

ශුද්ධාත්මයාණන් වහන්ස වැඩම කර ඔබගේ විස්වාසකයින්ගේ හෘදයන් පිරෙව්ව මැනව. ඔබගේ ප්‍රේමයේ ගින්න ඔවුන් තුල දැල්වුව මැනව.

ඔබගේ ස්ප්‍රීතුව යැව්ව මැනව. එවිට ඔවුහු මවනු ලබන්නෝය.

තවද ඔබවහන්සේ පෘථිවියෙහි මුහුණුවර අළුත් කර වදාරන සේක

**යාච්ඤා කරම්හ**

අපගේ පියාණන් වන දෙවියන් වහන්ස ඔබවහන්සේගේ ශුද්ධාත්ම දීමනා මුළු ලෝකය මත පතිත කර වදාළ මැනව. සුවිශේෂය ඉගැන්වීම ආරම්භ කිරිම සඳහා ඔබවහන්සේගේ ස්ප්‍රීතුව ඔබවහන්සේ ශුද්ධවූ සභාව වෙත එවා වදාල සේක. දැන්,විස්වාස කරන්නාවූ සියලු දෙනාගේම හදවත් මගින් එම ස්ප්‍රීතුවට නොකඩවා ක්‍රියාත්මක වන්නට සැලැස්සුව මැනව. මේ කී දේ අපගේ ස්වාමින් වන ක්‍රිස්තුන් වහන්සේ මගින් අපට ලැබේවා..ආමෙන්

ස්වාමිනී මාගේ තොල් විවෘත කර වදාළ මැනව.

එවිට මාගේ දිව ඔබවහන්සේගේ මහිමය ප්‍රකාශ කරන්නේය

ස්වාමිනී මාගේ සහයට වැඩම කර වදාල මැනව.

ස්වාමිනී මට ආධාර වන පිණිස කඩිනම් කළ මැනව.

පිතා පුත්‍රයා ශුද්ධාත්මයාණන් නම් ත්‍රීත්වේක දේවෝත්තමයාණන් වහන්සේට ස්ත්‍රෝත්‍ර වේවා

ආදියේ දි වුවාක් මෙන් දැනුත් නිතිපතාත් අනන්ත කාලයටම වේවා...ආමෙන්

**( ජපමාලය...අහස පොලව මැව්....)**

ක්‍රිස්තුන් වහන්සේගේ වාක්දාතවලට අප හේතුවන්ත වන පිණිස.

අති ශුද්ධවූ දේව මාතාවෙනී අප නිසා යාච්ඤා කළ මැනව.

**යාච්ඤා කරම්හ**

සර්වෝත්තම වු දෙවි පියාණනී, ඔබවහන්සේගේ ශ්‍රී කුමාරයාණෝ තමන් වහන්සේගේ ජිවිතය හා මරණයද මළවුන්ගෙන් උත්ථාන වීමද කරණකොට ගෙන නිත්‍ය ජිවිතයේ විපාකය අපට සම්පාදනය කර දූන් සේක් වේද. ඔවුන් වහන්සේගේ අති ශුද්ධවූ මාතාවන් වන කන්‍ය මරිය වහන්සේගේ අති ශුද්ධවූ ජපමාලයේ අභිරහස් භාවනා කිරීමෙන් එහි අන්තර්ගත ලෙසට ධර්ම ගුණ ක්‍රියා අනුසාර කිරීමටද ,එහි අන්තර්ගත පොරොන්දූ ඉටු කර ගැනීමටද අපට වරම් දෙනවා සොඳේ. මේ කී දේ අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ උදෙසාම අපට ලැබේවා. ආමෙන්.

ජේසුස් වහන්සේගේ ශ්‍රී ශුද්ධවූ දිව්‍ය හෘදයෙනී,

අපට කරුණා කළ මැනව.

- මරිය වහන්සේගේ නිර්මල වූ හෘදයෙනි
- ශුද්ධවූ ජුසේ තුමෙනී
- සුවිශේෂක ශුද්ධවූ ජුවාම් තුමෙනී
- ශුද්ධවූ ලුවී මාරී ද මොන්ෆර්ට් තුමෙනී

**අප නිසා යාච්ඤා කළ මැනව**

පිතාගෙත් පුත්‍රයාගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයෙන් ආමෙන්..

---

**2. කටේනාව..(සේනාවේ දැම්වැල)**

**අරුණාලෝකය මෙන් නැගී චන්ද්‍රයා මෙන් අලංකාරවද සූර්යයා මෙන් දීප්තිමත්වද යුද්ධයට සැරසුනු හමුදාවක් මෙන් බලසම්පන්නවද වඩින මේ උත්තමාව කවරෙක්ද**

මාගේ ආත්මය + ස්වාමීන් වහන්සේගේ මහිමය ප්‍රකාශ කරයි

මාගේ මුළු ජීවයම මාගේ ගැලවුම්කාර දෙවිඳුන් කෙරෙහි අතිශයින් ප්‍රීති ප්‍රමෝදයට පත් වෙයි

කුමක් නිසාදයත් එතුමාණෝ සිය දාසියගේ දීනතාව සලකා බැලූ සේක.

මෙතැන් සිට හැම පරපුරක් මට භාග්‍යවන්තී යැයි කියන්නාහ.

බල පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කල සේක

පරිශුද්ධයාණෝ යනු එතුමාණන්ගේ නාමයයි

ඔවුන් වහන්සේගේ දයා කරුණාව ඔවුන් වහන්සේට ගරු බිය දක්වන්නවුන් කෙරෙහි පරම්පරාවෙන් පරම්පරාවට පවතින්නේය

ඔවුන් වහන්සේ සිය භාහුවෙන් විකුම්පා උඩගු සිත් ඇත්තවුන් විසුරුවා හැර මහා නරපතීන් සිය සිහසුන වලින් පහත හෙළා දීනයන් උසස් කරන සේක.

ඔවුන් වහන්සේ සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යවන සේක.

ඔවුන් වහන්සේ අපගේ පියවරුන්වූ ආබ්‍රහාම්ට සහ එම පරපුරට සදහටම පොරොන්දු වූ දයාව සිහිකරමින් සිය සේවක ඊශ්‍රායෙල් සෙනගට පිහිටවන සේක.

පිතා පුත්‍රයා ශුද්ධාත්මයාණන් නම් ත්‍රිත්වේක දේවෝත්තමයාණන් වහන්සේට ස්තෝත්‍ර වේවා

ආදියේදි වූවාක්මෙන් දැනුත් නිතිපතාත් අනන්ත කාලයටම වේවා...ආමෙන්

**අරුණාලෝකය මෙන් නැගී චන්ද්‍රයා මෙන් අලංකාරවද සූර්යයා මෙන් දීප්තිමත්වද යුද්ධයට සැරසුනු හමුදාවක් මෙන් බලසම්පන්නවද වඩින මේ උත්තමාව කවරෙක්ද**

ජන්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳුනා වු මරියනී.

ඔබ වහන්සේගෙන් පිහිට ඉල්ලා සිටින්නාවු අප උදෙසා යාච්ඤා කළ මැනව.

**යාච්ඤා කරම්හ**

දෙවි පියාණන් ඉදිරියේ අප මධ්‍යස්ථකයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්ස ඔබ වහන්සේගේ මෑණියන් වන අති ශුද්ධවු කන්‍ය මරියෝත්තමාව අපගේ මෑණියන් ලෙසද ඔබ වහන්සේ ඉදිරියෙහි අපගේ මධ්‍යස්ථකාරිය ලෙසද පත් කිරීමට ඔබ වහන්සේ කරුණා අභිප්‍රාය වු සේක් වේද. ඔබ වහන්සේගේ පිහිට ඉල්ලා පැමිණෙන කවරකුට වුවද එතුමිය මාර්ගයෙන්ම එම පිහිට ලැබීමේ ප්‍රීති ප්‍රමෝදය උදා කළ මැනව. ආමෙන්

---

**3. හමුදාවේ යාච්ඤාව**

පිතාගෙත් පුත්‍රයාගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයෙන් ආමෙන්..

අතී ශුද්ධවු දේව මෑණියනී තේජස් සම්පන්න භාග්‍යවන්ත මෑණියනී, අපි ඔබගේ සරණය කරා දූව එමු. අපගේ ඕනෑකම්වලදී අප කරන යාච්ඤා ප්‍රතික්ෂේප නොකර සියලු අන්තරා වලින් නිරතුරු අප ගලවා ගත මැනව. ආමෙන්.

- දයාවේ අප මෑණියනී.......
- සකල වරප්‍රසාදයන්ගේ මධ්‍යස්ථකාරිය වන නිර්දෝෂ මරියනි...
- ශුද්ධවු මිඛායෙල් තුමනී, ශුද්ධවු ගාබ්‍රියෙල් තුමනී..
- මරිය වහන්සේගේ සුරදූත හමුදාවද ස්වර්ගීය බලතාවයන් වුද ඔබ සියල්ලෙනී
- ශුද්ධවු ස්නාවක ජුවාම් තුමනී..
- ශුද්ධවු පේදුරු තුමනී, ශුද්ධවු පාවුළු තුමනී..

**අප නිසා යාච්ඤා කළ මැනව**

අහෝ ස්වාමිණී, මරිය වහන්සේගේ ධජය යටතේ මෙහෙවර කරන්නාවූ අපට/ ලෝකය සටනින් ජය ගැනීමට/ ඔබ වහන්සේ කෙරෙහි පූර්ණ විස්වාසයද /එතුමිය කෙරෙහි විස්වාසනිත්වයද ප්‍රදානය කළ මැනව./ අප තුල ප්‍රාණවත් විස්වාසයක් ඇතිකර/ එය දයා ප්‍රේමයෙන් ජිවමානවී /අපගේ සියලු ක්‍රියා ඔබ වහන්සේ කෙරෙහී පිරිසිදු ප්‍රේමයෙන් කිරීමටද/ අපගේ අසල්වාසින් තුල නිරතුරු ඔබවහන්සේ දර්ශනය කර/ ඔවුන් තුල ඔබවහන්සෙට සේවාව කිරීමටද සලස්වා වදාල මැනව./ අපගේ ජීවිතයේ කුරුස, වෙහෙස මහන්සිවීම් සහ බලාපොරොත්තු සුන්වීම් මධ්‍යයේ /පර්වතයක් මෙන් නොසැලී /සාන්ත සිතින් යුක්තව සිටීමට හැකිවන පරිදි /ස්ථිරවූ විස්වාසයක් අපට දානය කල මැනව./ ඔබ වහන්සේගේ මහිමය සඳහාත් /මනුෂ්‍ය ආත්මයන්ගේ ගැලවීම සඳහාත් /මහත් දේ නොපසුබට වීර්යෙන් බාර ගැනීමටද /ඒවා ක්‍රියාත්මක කිරීමටද අප ධෛර්යවත් කරවන විශ්වාසයක් අපට දානය කල මැනව./ මෙලෝ සටන නිමවු පසු /හමුදා භටයන් වන අප එක් කෙනෙකුවත් නොහැර සියලු දෙනාටම/ ඔබ වහන්සේගේ  ප්‍රේමයේ සහ මහිමයේ රාජ්‍යයේ එකතු වන්නට හැකිවන පිණිස/ එක්සත්ව ඉදිරියට යාමට අපට මග පෙන්වීමටද/ සකල ස්ථානයන්හි දේව ප්‍රේමයේ ගින්න දැල්වීමටද/ අන්ධකාරයෙහි සහ මරණ සෙවනෙහි සිටින්නවුන් ආලෝකමත් කිරීමටද /ඇල් මැරුන වුවන් ජ්වලිතමත් කිරිමටද/ පාපය හේතු කොට ගෙන ආත්මික ලෙස නැසීගිය වුන් නැවත ප්‍රාණවත් කිරීමටද/ සාමයේ මාවතේ යාමට අපගේ පාද යොමු කරවන/ අපගේ හමුදාවේ ගිනි කනුව වැනි විස්වාසයක් අපට දානය කල මැනව. - ආමෙන්.

නැසීගිය අප භටයන්ගේ සහ සියලු ක්‍රිස්තියානින්ගේ ආත්මයෝ දේව දයාබර කමින් සමාදානයෙහි සැතපෙන ලද්දේවා. ආමෙන්.

- මරිය හමුදාව -<br>
ශුද්ධවූ ස්නාවක ජුවාම් දෙව් මැදුර,<br>
නාගොඩ ,කළුාන.<br>
2017. අගෝස්තු 30 වන දින.<br>
එම්.සි.පි...